ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021/2022
2 වන මට්ටම - II වන වර්ෂාර්ධය
අවසාන විභාගය
**DSC2713 - ජන සන්නිවේදනයේ මූලිකාංග**

කාලයඃ පැය තුනයි.

| | |
|---|---|
| දිනය: **2023 ජනවාරි 28** | **වේලාව: පෙ.ව. 9.30 - ප.ව. 12.30** |

උපදෙස්:

- ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නවයකින් (09) සමන්විත වේ.
- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලිව ලිවිය යුතුය.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු නව පිටුවකින් ආරම්භ විය යුතුය.

1. සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අවස්ථාවන් මොනවාදැයි පහදන්න.

**(ලකුණු 20 යි)**

2. සමාජ මාධ්‍යයන්හි ප්‍රබලතා මෙන්ම දුබලතා ඇති බව අපි දනිමු. විස්තර කරන්න.

**(ලකුණු 20 යි)**

3. ජනමාධ්‍ය කලාව උතුම් වූ වෘත්තියකි. මාධ්‍යවේදීන් ආචාරධර්මවලට ගරු කළ යුත්තේ ඇයිදැයි පහදන්න.

**(ලකුණු 20 යි)**

4. කොවිඩ් 19 වසංගතය පවතිද්දී පවුල තුල මෙන්ම පවුලෙන් පිට සන්නිවේදන ක්‍රියාවලියට සහ සම්බන්ධතාවයන්ට අහිසි බලපෑමක් ඇති විය. සාකච්ඡා කරන්න.

**(ලකුණු 20 යි)**

5. නොයෙකුත් සිදුවීම් මෙන්ම පුද්ගලයන් ප්‍රවෘත්ති බිහිකිරීමට හේතු වුවත්, සිදුවන සෑම දෙයක්ම ප්‍රවෘත්තිජනක සිදුවීම් නොවෙයි. පහදන්න.

**(ලකුණු 20 යි)**

6. මාධ්‍ය සමාජ වගකීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? පහදන්න.

**(ලකුණු 20 යි)**

7. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට වැදගත් වන්නේ ඇයිදැයි පහදන්න.

**(ලකුණු 20 යි)**

8. නිසිලෙස ඇහුම්කන්දීම සන්නිවේදනට අවශ්‍යතම දෙයකි. සාකච්ඡා කරන්න.

**(ලකුණු 20 යි)**

9. පහත සඳහන් මාතෘකා දෙකක් සම්බන්ධව කෙටි සටහන් ලියන්න.

   I. වාචික සහ නිර්වාචික සන්නිවේදනය

   II. ආකේතකරණය (Encoding)

   III. මුද්‍රිත මාධ්‍යයේ ඇති සීමිත බව

   IV. ගැටුම් නිරාකරණයට සහ කළමනාකරණයට හේතුවන්නා වූ මූලික කරුණු

**(2x 10 =ලකුණු 20 යි)**

*****ප්‍රකාශන හිමිකම් ඇවිරිණි*****